www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: සරසවි සිසුවාගේ මරනය ගැන පොලීසියට එරෙහිව ශිෂ්‍යයෝ විරෝධය දක්වති

## Sri Lankan students protest against police over university death

**සුරංග සිරිවර්ධන හා කපිල ප්‍රනාන්දු විසිනි.**

**2010 ජූලි 29**

පසුගිය දින තුන පුරා දහස් ගනන් සරසවි ශිෂ්‍යයෝ රුහුනු විශ්වවිද්‍යාලයේ තුන්වන වසරේ සුසන්ත අරුන බන්ඩාර ශිෂ්‍යයාගේ මරනයට එරෙහි විරෝධතාවන් වටා පෙල ගැසුනහ. රුහුනු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය විරෝධතාවයකට පොලීසිය එල්ල කල ප්‍රහාරයකින් මසකට පසුව ජූලි 24 දින ඔහු මිය ගියේ ය.

බන්ඩාරගේ මරනයට වගකිව යුතු පොලිස් නිලධාරීන් අත්අඩංගුවට ගන්නා ලෙසට බලකරමින් 26 දින පේරාදෙනිය, සබරගමුව, කැලනිය, රජරට, රුහුන හා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයන් හි ශිෂ්‍යයෝ විරෝධතා දැක්වූහ. 28 දින කොලඹ නගර මධ්‍යයේ පැවති විරෝධතාවට 2,000 ට අධික සිසුන් සංඛ්‍යාවක් සහභාගී විය. සිසුන් පොලිස් මූලස්ථානය වෙත ගමන් ගැනීම වැලැක්වීම සඳහා කැරලි මර්දන කන්ඩායම් ද ඇතුලු දහස් ගනනක හමුදා භටයන් හා පොලීසිය යොදවා තිබුනි.



**සුසන්ත අරුන බන්ඩාර**

බන්ඩාර ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) අනසක යටතේ ක්‍රියාත්මක වන අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමන්ඩලයේ (අ වි ශි බ ම ) ක්‍රියාකාරිකයෙක් විය. මෙම සංවිධාන දෙක සිසුවාගේ ඛේදජනක මරනය ගසා කමින් සිසු අයිතීන් ආරක්ෂා කරන්නේ තමන් යයි හුවා දැක්වීමට එය අවස්ථාවක් කරගත්තාක් සේම අවිශිබමය තම විරුද්ධවාදීන්ට එරෙහි ප්‍රචන්ඩත්වය යොදා ගැනීම මගින් පොලිස් ප්‍රහාරය සඳහා නිමිත්ත නිර්මානය කිරීමට ද උදව් විය.

ජූනි 16 වනදා, අවිශිබමය තමන්ගේ ඊනියා විරුවන් සැමරීමට සූදානම් වෙමින් සිටිය දී ආන්ඩු ගැති මැර කල්ලියක් රුහුනු සරසවියේ එහි ආධාරකරුවන්ට පහර දී ඇති අතර මීට පෙර ද විපක්ෂ හා ආන්ඩු ගැති ශිෂ්‍ය කන්ඩායම් අතර ප්‍රචන්ඩ ගැටුම් හටගෙන තිබේ. සිය විරුද්ධවාදීන්ට එරෙහිව මැර බලය යොදාගැනීම පිලිබඳව ජවිපෙ මෙන්ම අවිශිබමය ද කුප්‍රකටය.

ඔවුන් සූදානම් වෙමින් සිටියේ 1980 ගනන් අග භාගයේ ආරක්ෂක හමුදා අතින් මියගිය ශිෂ්‍ය ක්‍රියාකාරීන් සැමරීම සඳහාය. එම අවධියේ ජවිපෙ මැර කල්ලි ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහි තම ස්වෝත්තමවාදී උද්ඝෝෂනයට සහය දැක්වීම ප්‍රතික්ෂේප කල කම්කරුවන්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන් හා දේශපාලන විරුද්ධවාදීන් සිය ගනනක් ඝාතනය කලහ. මුලින් ජවිපෙ සමග සහයෝගයෙන් කටයුතු කල එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව පසුව ජවිපෙ සාමාජිකයින් ද ඇතුලු ගම්බද තරුනයින් 60,000 දෙනා කුරිරු ලෙස මරා දැමුනු ඝාතන රැල්ලක් දියත් කලේ ය.

අවිශිබම කන්ඩායමට එරෙහි ප්‍රහාරයෙන් පසුව තමන්ට ආරක්ෂාව සලසන ලෙස ඉල්ලමින් ජූනි 17 දින ශිෂ්‍ය සංගමය විශ්වවිද්‍යාලය වාඩි ලා ගැනීමක් සංවිධානය කලේ ය. සරසවිය ඇතුලත මෙන්ම පිටත ද හටගත් සිදුවීම් ගනනාවක් ද ශිෂ්‍යයන්ට අඩන්තේට්ටම් කිරීමේ සිද්ධීන් ද එය ගෙනහැර පෑවේය. විශ්වවිද්‍යාල බලධාරීන් එයට ප්‍රතිචාර දැක්වූයේ පසු දින සරසවිය වසා දමා වාඩිලා ගෙන සිටි සිසුන් පලවා හැරීමට පොලීසිය කැඳවීමෙනි.

සිසුන් ඉවත් කිරීම සඳහා පොලිස් නිලධාරීන් 200 පමන පැමිනි අතර ශිෂ්‍යයන් ගොඩනැගිලිවලින්

ඉවත් වීමට එකඟ වූ පසුව පොලීසිය ඔවුන්ගෙන් සමහරෙක් බස්රථ මගින් නේවාසිකාගාර වෙත ගෙන ගියේ ය. ඔවුන් නේවාසිකාගාර වෙත ගෙන ආ විගස පොලීසිය ගේට්ටු අවුරා ශිෂ්‍යයන්ට පහර දුන්නේ ය. දරුනු ලෙස පහර කෑ අය අතර බන්ඩාරත් සිටි බව ඔහුගේ මිතුරෝ *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසූහ.

උනවටුන නම් දුෂ්කර ගම්මානයක පිහිටි සිය නිවසට පැමිනි බන්ඩාර පසුදින වමනය කිරීමට පටන් ගත් අතර උනෙන් පෙලෙන්නට විය. ඔහුගේ මව ආසන්නයේ පිහිටි බුත්තල රෝහලට හා පසුව දියතලාව රෝහල වෙත ඔහු රැගෙන ගියා ය. අවසානයේදී ඔහු බදුල්ල රෝහලට මාරු කරන ලද අතර පසුගිය සතියේ ඔහු එහිදී මිය ගියේය.

පොලීසිය සිසුවාගේ මරනය පිලිබඳ කිසිදු වගකීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන නමුත් ඔවුන්ගේ පරස්පර විරෝධී ප්‍රකාශයන් පෙන්නුම් කරන්නේ කැත වසන් කිරීමකි. පසුගිය සිකුරාදා පැවති මාධ්‍ය සාකච්ඡාවක දී පොලිස්පති මහින්ද බාලසූරිය කියා සිටියේ අධිකරන වෛද්‍ය නිලධාරිවරයාගේ (ජේඑම්ඕ) වාර්තාවෙන් විනිශ්චය කර ඇත්තේ මරනයට හේතුව විපරීත රුධිර නාලයක් හේතුකොටගෙන සිදුවූ අභ්‍යන්තර ලේ ගැලීමක් බවය. ඔහු තවදුරටත් සඳහන් කලේ ජේඑම්ඕ වාර්තාව පහරදීමක් පිලිබඳ සාක්ෂි කිසිවක් නොමැති බව කියා ඇති බවයි.

බන්ඩාරගේ මරනයත් සමග පොලීසියට කිසිදු සම්බන්ධයක් නොමැති බව මාතර නියෝජ්‍ය පොලිස්පති නීල් දලුවත්ත එදින ම ප්‍රකාශ කලේ ය. විරුද්ධ කන්ඩායමක ශිෂ්‍යයකු බන්ඩාරට පහර දී තිබෙන බව කියමින් ඔහු වෙනත් පැහැදිලි කිරීමක් ඉදිරිපත් කලේ ය. "බස්නායක නැමැති ශිෂ්‍යයකු බන්ඩාරගේ හිසට පහර දී තිබේ" යයි කියමින් පසු දිනයේ දී පොලිස්පති බාලසූරිය ඔහුගේ ස්වරය වෙනස් කලේ ය. පොලීසිය දැන් බස්නායක සොයමින් සිටියි.




***කොලඹදී උද්ඝෝෂනයේ යෙදුනු දේශීය වෛද්‍ය සිසුන්***

ආන්ඩුව පැහැදිලිව ම පුලුල් ශිෂ්‍ය නොසන්සුන්භාවයක ඇඟවුම් පිලිබඳව උත්සුක වී සිටී. ජනාධිපති මහින්ද රාජපක්ෂ පොලීසියෙන් හා විශ්වවිද්‍යාල බලධාරීන්ගෙන් වාර්තාවක් ඉල්ලා තිබේ. කුමන හෝ දේශපාලන විරුද්ධත්වයක් ප්‍රකාශවීම වැලැක්වීම සඳහා සති අන්තයේ පැවති බන්ඩාරගේ අවමංගල්‍යට බෙහෝකොටම සිවිල් ඇඳුමින් සැරසුනු නිලධාරීන් ද ඇතුලුව දැඩි පොලිස් රැකවරන යොදා තිබුනි.

බන්ඩාරගේ මරනය ආන්ඩුව විශ්වවිද්‍යාල අධ්‍යාපන පහසුකම් කැපීම කෙරෙහි සිසුන් අතර පවතින පුලුල් විරුද්ධත්වය ගොනු කරන කාරනාවක් වනු ඇතැයි රාජපක්ෂ කනස්සල්ලට පත්ව සිටියි. ගරාවැටුනු පහසුකම් හා තදබදයෙන් යුත් දේශන ශාලා ද ඇතුලු පහත් අධ්‍යාපන හා ජීවන තත්වයන්ට සිසුහු දැනටමත් මුහුන දෙති. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ඉල්ලා සිටින කප්පාදු පියවරයන්ගේ කොටසක් ලෙස ආන්ඩුව අධ්‍යාපන වියදම් කැපීම හා පුද්ගලික විශ්වවිද්‍යාල දිරි ගන්වන විට මේ තත්වය තවත් නරක අතට පමනක් හැරෙනු ඇත.

අධ්‍යාපන ආයතනවල "නවක වදය" හා අනෙකුත් ප්‍රචන්ඩ ක්‍රමවේදයන්ට එරෙහි කුරිරු නීති යලි පනගන්වමින් රුහුනු සරසවියේ ප්‍රහාරය සඳහා ආන්ඩුව සූදානම්ව සිටියේය. විරෝධතා හා වාඩි ලා ගැනීම් ඇතුලු ශිෂ්‍යයන්ගේ දේශපාලන කටයුතු තහනම් කිරීමේ හා සරසවි තුලට පොලීසිය කැඳවීමේ පුලුල් බලතල මෙම නීතිය මගින් විශ්වවිද්‍යාල බලධාරීන්ට ලැබී තිබේ.

"නවක වධය" ලෙස සලකන නවක සිසුන් සමච්චලයට බඳුන් කිරීම හා බියවැද්දීමේ අරමුනුනෙන් සැලසුම් කෙරුනු තම භාවිතාවන් මගින් මෙම නීතිය ක්‍රියාත්මක කිරීමට නිමිත්ත අවිශිබමය විසින් සපයා දී ඇත. සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) ඇතුලු අනෙකුත් ශිෂ්‍ය සංවිධානවලට පහර දීමටත් හිරිහැර කිරීමටත් බලල් අත කරගනු ලබන තමන්ගේ අනුගාමික කල්ලි ගොඩ නඟා ගැනීමට අවිශිබමය එවැනි පසුගාමීත්වයන් මත වාරුවී සිටියි. එසේ කිරීමේ දී අවිශිබමය සමස්තයක් වසයෙන් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් මත පුලුල් දේශපාලන මර්දනයකට දොර විවර කර දී ඇත. උදාහරනයක් වසයෙන් කොලඹ විශ්ව විද්‍යාල බලධාරීහු ජවිපෙ හා ප්‍රතිවාදී කන්ඩායම් අතර ප්‍රචන්ඩ ගැටුම් හුවා දක්වමින් ශිෂ්‍ය සංගමය අහෝසි කර තිබේ.

28 දින කොලඹ දී පැවත්වූ විරෝධතාව අමතමින් අවිශිබමයේ කැඳවුම්කරු වන උදුල් ප්‍රේමරත්න තම සංවිධානය ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කරන බවක් මවා පෑමට වෑයම් කලේය. ඔහු ආන්ඩුවේ "ප්‍රජාතන්ත්‍ර-විරෝධී යුද්ධය" හෙලාදැක්කේ, ආන්ඩුව උතුරේදී යොදාගත් ක්‍රමවේදයන්ම දකුනේදීත් යොදාගැනීමට නොපැකිලෙන බව කියා පාමිනි. එල්ටීටීඊයට එරෙහිව සමස්ත උතුරුකරය අලලා ගත් රාජපක්ෂගේ යුද්ධය තුලදී ඔහු ක්‍රියාවට දැමූ ප්‍රජාතන්ත්‍ර-විරෝධී පිලිවෙත් සියල්ලටම ජවිපෙ සහ අවිශිබමය මුලු හදින්ම සහය දුන්නේය යන කාරනයෙන් මෙම මවාපෑමේ හිස්බව ප්‍රකට වේ.

පසුගිය වසරේ එල්ටීටීඊ පරාජයත් සමඟ නිමා වූ යුද්ධය පැවති අවධිය තුලදී "පලමුව මව්බිම" යන සටන් පාඨය යටතේ ශිෂ්‍යයන් කැපකිරීම් කලයුතු බැව් අවිශිබමය අවධාරනය කලේය. ආන්ඩුවේ ජරා වැඩ කරට ගැනීම පිලිබඳව ප්‍රේමරත්න "මව්බිම රැකගත්" පොලීසියට බැන වැදුනි. රාජපක්ෂ "ආඥාදායක මාවතේ" ඉදිරියට යමින් සිටින බව ඔහු ප්‍රකාශ කලේය. එහෙත් අවිශිබ උද්ඝෝෂනයේ ඉලක්කය වී ඇත්තේ සහන ඉල්ලා ආන්ඩුවට බලපෑම් දැමීමයි.

2005 ජනාධිපතිවරනයේදී රාජපක්ෂ වෙනුවෙන් ජවිපෙ ක්‍රියාශීලිව ප්‍රචාරනයේ යෙදුන අයුරුත් එල්ටීටීඊයට එරෙහිව යුද්ධය නැවත අරඹන ලෙස ඔහුට බලකල බවත් ශිෂ්‍යන් සිහියට නඟාගත යුතුය. මෙම වසරේ ජනවාරියේදී පැවති ජනාධිපතිවරනයේදී ජවිපෙ හිටපු හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා ඒකාබද්ධ විපක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වසයෙන් ඉදිරිපත් කිරීමට පිටුබලය දුන් අතර දැන් ඔහු සමඟ නිල සන්ධානයක් පවත්වා ගෙන යයි. තමන්ගේ මැතිවරන ව්‍යාපාරය තුලදී ෆොන්සේකා තමන් ද රාජපක්ෂ තරම් ම නිර්ධය අයුරින් නිදහස් අධ්‍යාපනයට ද එතරම් ම විනාශකාරී වන වෙලඳපොල ගැති න්‍යාය පත්‍රය ක්‍රියාවට දමන බව පැහදිලි කලේය.

රාජපක්ෂ ආන්ඩුවේ නිර්දය පොලිස්-රාජ්‍ය සැලසුම්වලට එරෙහිව තම අයිතීන් රැක ගැනීමට ගෙන යන්නා වූ ශිෂ්‍ය අරගලයට සසජාශි මුලුමනින්ම සහය පල කරයි. එහෙත් ෆොන්සේකා වැනි ධනවාදයේ දක්ෂිනාංශික රැකවලුන්ට ශිෂ්‍යයන් ගැටගසන අවිශිබමයේ ධජය යටතේ ඔවුන්ට එය කල නොහැකිය. ඔවුන්ට එය තනිවම ද කල නොහැකියඃ ශිෂ්‍යයන් කම්කරු පන්තිය වෙත හැරිය යුතු අතර අධ්‍යාපනයට එල්ල කරන ප්‍රහාරයන්ගේ මූලය වන ලාභ පද්ධතියට හා රාජපක්ෂ අන්ඩුවට එරෙහිව ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීමට කම්කරුවන්ට ඔවුන් සහාය දිය යුතුය.

අතලොස්සක් ධනවතුන්ගේ ලාභ උදෙසා නොව, බහුතරයකගේ අවශ්‍යතාවන් ඉටුකරගත හැකි අයුරින් සමාජය ප්‍රතිසංවිධානය කිරීමේ සමාජවාදී වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කරනුවස් කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා සටනට කම්කරුවන් සමඟ ඒකාබද්ධ වන ලෙස සසජාශි සහ සමාජවාදී සමානතා පක්ෂය ශිෂ්‍යයන් වෙත කැඳවුම් කර සිටී. සියලු යෞවනයන්ට නිදහස් හා උසස්-ගුනාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහතික කරනු වස් රුපියල් බිලියන ගනනක් සම්පාදනය කල යුතුය.

එවැනි අරගලයක් සඳහා කම්කරුවන් එක්සත් කිරීමේ මූලික පූර්ව කොන්දේසිය වන්නේ ජවිපෙ හා අවිශිබමයේ සිංහල අධිපතිවාදය ද ඇතුලු ජාතිකවාදයේ හා වර්ගවාදයේ සකල රූපාකාරයන් ප්‍රතික්ෂේප කිරීමයි. සසජාශි සටන් වදින්නේ දකුනු ආසියාවේ සහ ජාත්‍යන්තරව සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා අරගලයේ කොටසක් වසයෙන් ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් වෙනුවෙනි. මෙම අරගලයට සම්බන්ධ වන මෙන් අපි ශිෂ්‍යන්ගෙන් ඉල්ලා සිටිමු.

© www.wsws.org